# දෙපාර්තමේන්තු චක්‍රලේඛ : 04/2009

මගේ අංකය- ප/13/3/8.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
පේරාදෙණිය.
2009.06. 22

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් /
අධ්‍යක්ෂ (පරිපාලන/මූල්‍ය/සැලසුම් හා ආර්ථික/සත්ව අභිජනන
සත්ව සෞඛ්‍ය/මානව සම්පත් සංවර්ධන
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ ප්‍රධාන කලමණාකරන සහකාර.

<u>රාජ්‍ය නිලධාරීන්ගේ නිවාඩු.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් අංක 1589/30 - 2009 පෙබරවාරි 20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව. දෙපාර්තමේන්තු නිලධාරීන් හා සේවකයින් නිවාඩු ලබාගැනීම සම්බන්ධයෙන් දැනුවත් කළයුතුව ඇත.

02. ඒ අනුව. මින් ඉදිරියට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 162, 03/92 හා 06/04 හි විධිවිධාන වලට අමතරව. 2009.02.20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ XV වැනි පරිච්ඡේදයේ 170, 171, හා 172 හි දැක්වෙන පහත සඳහන් කරුණු කෙරෙහි ඔබ අංශයේ සියළුම නිලධාරීන් හා සේවකයින් දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

03. 170, 171, හා 172 වගන්තිවල උධෘතයක් මතු දක්වා ඇත.

I70) සෑම රජයේ නිලධරයෙකුම විධිමත් පරිදි නිවාඩු අනුමත කරවාගෙන ඇත්නම් මිස, අනිවාර්යයෙන්ම තම රාජකාරි සඳහා වාර්තා කළ යුතුය

I71) කිසියම් අවස්ථාවක දී රජයේ නිලධරයෙකුට තම සේවා ස්ථානයට වාර්තා කිරීමට අපහසු වන්නේ නම්, ඔහුට පැවරී ඇති රාජකාරි ඉටු කරවා ගැනීම සඳහා විකල්ප ක්‍රියා මාර්ග යොදා ගත හැකි වන අයුරින් එම නොපැමිණීම පිළිබඳව කල් වේලා ඇතිව නියමිත බලධරයාට දන්වා විධිමත් පරිදි නිවාඩු අනුමත කරවා ගැනීම එම රජයේ නිලධරයාගේ වගකීම වන්නේය. එසේවුවද වුවත් කිසියම් රජයේ නිලධරයකුට, නිවාඩු අනුමත කරවා ගැනීමකින් තොරව නොවැළැක්විය හැකි හේතුවක් මත රාජකාරි සඳහා වාර්තා කිරීමට අපහසු වන අවස්ථාවකදී, එම දිනයේ ඔහුගේ රාජකාරිය ආරම්භ කිරීමට නියමිතව තිබූ වේලාවේ සිට පැය 24 ක කාලයක් තුළ කුමන ආකාරයකින් හෝ ඒ පිළිබඳව ආයතන ප්‍රධාන වෙත දැනුම් දීම එම නිලධරයාගේ වගකීම වේ.

I72) ඉහත 171 වන වගන්තියෙහි සඳහන් පරිදි ආයතන ප්‍රධානී වෙත නොදන්වා රාජකාරියට වාර්තා නොකර සිටින නිලධරයකු සිය තනතුර අතහැර ගියා සේ සැලකෙන්නේය. ඒ අනුව, ඒ බැව් නිලධරයා වෙත ලියාපදිංචි තැපැලෙන් අංක 12 පරිශිෂ්ටය ප්‍රකාරව වහාම දන්වා යැවීම, නිලධරයාගේ පත් කිරීමේ බලධරයාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීගේ හෝ පළාත් දිස්ත්‍රික්/ප්‍රාදේශීය දෙපාර්තමේන්ත ප්‍රධානගේ හෝ ආයතන ප්‍රධානගේ හෝ වගකීම වන්නේය. පත් කිරීම් බලධරයා හැර වෙනත් බලධරියකු විසින් එම දන්වා යැවීම කරන ලද කල්හි, එහි පිටපත් පත්කිරීම් බලධරයා වෙත හා අනෙකුත් අදාළ බලධරයන් වෙත යොමු කිරීමට ද ක්‍රියා කළ යුතුවේ.

එච්.එම්.එස්.පී. හේරත්.
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.